# පිළිකුත්තුව රජමහා විහාරය ආශ්‍රිත උරුම කළමනාකරණය

ජේ. එම්. ලියනගේ

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. jeewa91liyanage@gmail.com

ප්‍රමුඛ පදඃ පිළිකුත්තුව, සුවිශේෂී, අගය, පියවර, උරුම කළමනාකරණය

## හැඳින්වීම

උරුම කළමනාකරණය යන්නෙහි සරල අදහස වන්නේ යම් පුරාවිද්‍යාත්මක උරුම ස්ථානයක් හෝ වේවා ස්වාභාවික උරුම ස්ථානයක් හෝ වේවා එම ස්ථානයේ පවතින අගයන් ආරක්ෂා කරමින් අනාගතය කරා රැගෙන යාම සඳහා කරනු ලබන යම් ක්‍රමවේදයකි. ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලයේ පිළිකුත්තුව නම් ගමෙහි පිහිටා ඇති පිළිකුත්තුව රජමහා විහාරය එවැනි ආරක්ෂා කරගත යුතු උරුමයකි. බුත්පිටිය, යොන්ගන්මුල්ල, කොස්කඳවල, අඹගස්පිටිය, මාළිගාතැන්න, කඳුමුල්ල යන ගම් හයට මැදිව පිහිටා ඇති, අගයයන් කීපයක් මත සුවිශේෂී වන්නා වූ පිළිකුත්තුව රජමහා විහාරයේ අගයයන් ආරක්ෂා කරමින් ශ්‍රී ලංකාවේ පවතින උරුමයක් වශයෙන් අනාගතය වෙත පවත්වාගෙන යන්නේ කෙසේද යන ගැටලුව මත මෙම පර්යේෂණය සිදු කරන ලදී. ඒ අනුව විහාරස්ථානය ආශ්‍රිතව උරුම කළමණාකරණ සැළැස්මක් සකස් කර විහාරස්ථානයේ අගයයන් ආරක්ෂා කරමින් අනාගතය වෙත පවත්වාගෙන යාමට යෝජනා කිරිම මෙහි දී සිදු කළේය.

## ක්‍රමවේදය

පිළිකුත්තුව රජමහා විහාරය පිළිබඳ පර්යේෂණය සිදු කරගෙන යාමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනයක් මෙන් ම ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයක් ද සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයන් වශයෙන් පිළිකුත්තුව විහාරස්ථානයට ගොස් තොරතුරු රැස් කළේ ය. එහි දී විහාරාධිපති ස්වාමීන් වහන්සේගෙන් හා පුරාවිද්‍යා කාර්යාලයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට දත්ත රැස් කිරීම කළ අතර පිළිකුත්තුව ලෙන් සහිත භූමිය පුරා ඇවිද ඒවායේ ඡයාරූප ආදිය ලබා ගනිමින් දත්ත රැස් කළේය. ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය හරහා පුස්තකාල පරිශීලනය සිදු කරන ලදී. ලබා ගත් දත්ත ආශ්‍රයෙන් පියවරයන් පහක් යටතේ මෙම උරුම කළමණාකරණ සැළැස්ම සකස් කරමින් පර්යේෂණය සිදු කළ අතර එහි පළමු පියවර යටතේ අගයයන් හඳුනාගැනීම සිදු කළේය. ඒ අනුව ඓතිහාසික අගය, ආර්ථික හා භාවිතාමය අගය, වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අගය, පාරිසරික හා සෞන්දර්යාත්මක අගය, විද්‍යාත්මක හා අධ්‍යාපනික අගය, සමාජීය හා අධ්‍යාත්මික අගය වශයෙන් අගයයන් කීපයක් හඳුනාගත් අතර දෙවන පියවර යටතේ එම අගයයන් ආරක්ෂා කර ගැනීමට ප්‍රතිපත්ති සකස් කිරීමත් තෙවන පියවර යටතේ ප්‍රතිපත්ති සඳහා උපක්‍රම සකස් කිරීමත් සිව්වනුව ඒවා ක්‍රියාවන් බවට පත් කර පස්වන පියවර යටතේ ඇගයීම් හා පසු විපරම් කර උරුම කළමණාකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සිදු කරමින් පිළිකුත්තු රජමහා විහාරය අනාගතය වෙත පවත්වාගෙන යාම මින් සිදු කෙරේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අක්කර 200 ක් තරම් භූමි ප්‍රමාණයක් සහිත ආරණ්‍ය සේනාසනයක නටඹුන්

දැකිය හැකි හා ලෙන් 99කින් යුතුවන සුන්දර වන පියසකින් යුක්ත පිළිකුත්තුව රජමහා විහාරය ඓතිහාසික වශයෙන් ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් යටත් විජිත සමයේ බ්‍රිතාන්‍යය යුගය දක්වා මානව ක්‍රියාකාරකම් සිදු වූ භූමියකි. අනුරාධපුර අවධියේ දී මෙම ලෙන් සහිත භූමිය භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළ පුදබිමක් වශයෙන් භාවිතා කර ඇත. මෙහි ඇති ලෙන් ලිපියකින් ද මේ බැව් තහවුරු වේ. "*අණිකටශ බතු නො අගිබුති නො දිනෙ අගත අනගත චතුදිශ ශගශ*" (දමයන්ති, 2005; 5 පි) මෙම භූමියහි ඇති ඓතිහාසික අගය ආරක්ෂා කිරීම සඳහා මා යෝජනා කීපයක් තෙවන පියවර යටතේ ඉදිරිපත් කරනු ලැබිය .අදාළ පුරාවිද්‍යා භූමියේ සීමාවන් වෙන වෙන ම හඳුනා ගැනීම, ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම, සංරක්ෂණය හා ක්‍රමවත් නඩත්තුවක් පවත්වා ගෙන යාම, ස්මාරක ආරක්ෂා කිරීම පිළිබඳව දක්වෙන නීති රීති ප්‍රදර්ශනය කිරීම යන උපක්‍රම භාවිතා කරමින් මෙහි පවතින ඓතිහාසික අගය ආරක්ෂා කිරීමට යෝජනා කරන්නෙමි.

මෙහි දැනට පවතින ආර්ථික හා භාවිතාමය අගය ආරක්ෂා කිරීම සඳහා ප්‍රදේශයේ දැනට පවතින සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තුවේ. ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම, විහාරස්ථානය පිළිබඳ ඇතුළත් පොත්පත් හා සංයුක්ත තැටි අළෙවි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක ව්‍යාපාරය නගා සිටුවීම, යන යෝජනා ඉදිරිපත් කිරීම හරහා ආර්ථික අගය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

විහාරස්ථානයේ යුග කීපයකම වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් පවතී. වරිච්චි බිත්ති සහිත කටාරම් කෙටූ ලෙන්වලින් මුල් කාලීන යුගයේ වාස්තුවිද්‍යාවත් ආවාස ගෙවල්වලින් යටත් විජිත සමයේ ගොඩනැගිලිවල දක්නට ඇති වාස්තු විද්‍යාවත් පෙන්නුම් කරන අතර මහනුරවර යුගයේ නිර්මාණය කරන ලද දැව පාලම වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතර සුවිශේෂ වේ. (දමයන්ති, 2005; 10-18 පි) එසේම නුවර යුගයේ සිතුවම් කලාව නියෝජනය කරන්නා වූ සිතුවම් හා බටහිර ආභාසය ගත්තා වූ සිතුවම් ද මෙහි වේ. ඒ අතර දොරටුපාල රූප වෙනුවට ඇති පෘතුග්‍රීසි හේවායින්ගේ රූප, යුරෝපීය ආභාසය ගත්තා වූ අශ්ව කරත්තයන්, පෙට්ටගම්, කවිච්චි, තිර රෙදි ආදියත් විදේශීය ආභාසයෙන් යුත් ඇඳුම් පැළඳුම් දකගත හැක. මෙවැනි වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක අගයන් ආරක්ෂා කිරීම සඳහා උපක්‍රම කීපයක් වශයෙන් සිතුවම් ආරක්ෂා කිරීම, වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම, අනවශ්‍ය ඉදිකිරීම් ඉවත් කිරීම. යන යෝජනා ඉදිරිපත් කරමින් පවතින ඉදිකිරීම් හා සිතුවම් ආරක්ෂා කිරීමට අදහස් කෙරේ.

පිළිකුත්ව රජමහා විහාර භූමියේ වන පියස තුළ ප්‍රදේශයට ආවේණික ශාක හා සත්ත්ව විශේෂ කීපයක් ම දකගත හැකි ය. පොදුවේ මෙහි සත්ත්ව විශේෂ 170ක් පමණ වන අතර ඒ තුළ සමනළ විශේෂ 52, කුරුලු වර්ග 80ක්, මත්ස්‍ය විශේෂ 20ක් පමණ හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ විශාලත්වයෙන් දෙවන ස්ථානයට පත් යෝධ පුස්වැල ලෙන් අංක 38, 40 යන ලෙන් පිහිටි පර්වත සමීපයේ පිහිටා ඇත. මෙවැනි පාරිසරික හා සෞන්දර්යාත්මක වශයෙන් ඉහළ අගයක් පවතින්නා වූ මෙම විහාරස්ථානයේ වනපියස ආරක්ෂා කර ගැනීම සඳහා සත්ත්ව හා ශාක විශේෂ ආරක්ෂා කිරීම, පාරිසරික හා භූ භෞතික තත්ත්වය ආරක්ෂා කිරීම වශයෙන් උපක්‍රම ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන්, පරීක්ෂක කණ්ඩායම් යන පිරිස් මෙම

භූමිය පිළිබඳව පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදු කරන අතර විශේෂයෙන් ම කොළඹ නගරයට නුදුරින් පිහිටි වනගත ප්‍රදේශයක් වීම තුළ තෙත් කලාපීය වනාන්තරයක් වශයෙන් මෙම භූමිය සුරැකිව පැවතීම නිසා මෙහි වාසය කරන්නා වූ ශාක විශේෂ, සත්ත්ව විශේෂ පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකි වේ. මෙම අධ්‍යාපනික අගය ඉහළ දැමීම සඳහා එම පර්යේෂණ කටයුතු සිදු කරන්නන් හට දැනට පවතින ආකාරයට වඩා පහසුකම් සැළසීම තෙවන පියවරෙහි උපක්‍රමයක් වශයෙන් ඉදිරිපත් කෙරේ.

ප්‍රදේශයේ ජනතාවට වැඳුම් පිදුම් කිරීමට උපකාරී වන්නා වූ මෙම විහාරස්ථාන භූමියේ එම වැඳුම් පිදුම් කිරීමට අවශ්‍ය භෞතික සම්පත් ගොඩනැගීම උපක්‍රමයක් වශයෙන් යෝජනා කිරීම හරහා මෙහි සමාජීය හා ආධ්‍යාත්මික අගය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

පර්යේෂණ ක්‍රියාවලියේ දී සිව්වන පියවර යටතේ මතු දක් වූ උපක්‍රම ක්‍රියාවට නැංවීම සිදුකරන අතර ඒ හරහා මාගේ උරුම කළමනාකරණ සැළැස්ම සක්‍රිය ක්‍රියාවලියක් බවට පත් කරන්නේ ය. මේ සඳහා විවිධ පුද්ගලයින්ගේ දායකත්වය ලබා ගනිමින් එම ක්‍රියාව සාර්ථක කර ගැනීම අපේක්ෂා කරයි. පර්යේෂණයේ පස්වන පියවර යටතේ ඇගයීම් හා පසුවිපරම් කිරීම සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය හරහා මාගේ කළමනාකරණ සැළැස්මේ යම් අවුපාඩුවක් සිදු වී ඇත්නම් ඒවා නැවත සකස් කර යථාවත් කිරීම හා ක්‍රියාත්මක කරන ලද ප්‍රත්පත්ති නිසි අයුරින් ක්‍රියාවට නැංවීද යන්න විමර්ශනය කරන්නේය. ඇගයීම හා පසු විපරම කොටස් කීපයකට වෙන්කර සිදු කරන අතර ඒ හරහා කිසිඳු මග හැරීමක් සිදු නොවීමට අදහස් කෙරේ. ඒ අනුව උරුම දේපළ පිළිබඳ පසු විපරම, ඉදිකිරීම් හා යටිතල පහසුකම් ආශ්‍රිත පසු විපරම, සංචාරක කටයුතු ආශ්‍රිත පසු විපරම, පරිසරය ආශ්‍රිත පසු විපරම, ආර්ථික කටයුතු ආශ්‍රිත පසු විපරම වශයෙන් මෙම පියවර දියත් කිරීමට අදහස් කෙරේ.

මේ ආකාරයෙන් පිළිකුත්තුව රජමහා විහාර භූමිය ආශ්‍රිත උරුම කළමණාකරණ සැළැස්මක් සකස් කිරීම හරහා සමාජයේ පවතින උරුම ස්ථානයක් වශයෙන් මෙම විහාරස්ථානය හා එම අවට භූමිය අනාගතය කරා පවත්වා ගෙන යාමට හැකි වේ.

ආශ්‍රිත ග්‍රන්ථ


තෙන්නකෝන්, සංජීව ප්‍රසන්න (2006) *පිළිකුත්තුව රජමහා විහාරය.* බුත්පිටිය. පිළිකුත්තුව රජමහා විහාරය

දමයන්ති එම්. ඒ. එම්. (2005) *පිළිකුත්තුව චාරිකාව.* ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10

පිළිකුත්තුව රජමහා විහාරය. *ගවේෂණ වාර්තාව*